ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: **dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය: **www.cbsl.gov.lk**

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2019 ජූලි 15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2019 ජූනි

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**
**53.9**
**2019 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 3.2 ක ඉහළ යාමකි.**

2019 ජූනි මාසයේ දී නිෂ්පාදන ක්‍රියාකාරකම් වැඩි වේගයකින් වර්ධනය විය. ඒ අනුව, 2019 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 3.2කින් ඉහළ යමින් 2019 ජූනි මාසයේ දර්ශක අගය 53.9 ක් ලෙස වාර්තා කරන ලදී. පාස්කු ඉරිදා දින සිදුවූ ප්‍රහාරයෙන් පසු දක්නට ලැබුණු සේවා නියුක්තියේ අඩු වීම නැවත යථා තත්වයට පත් වෙමින්, විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග සහ රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයන්හි සේවා නියුක්තිය ඉහළ යාම, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ මෙම ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ නව ඇණවුම් සහ නිෂ්පාදන ක්‍රියාකාරකම්හි සිදුවූ ඉහළ යාම ද 2019 ජූනි මාසයේ දී නිෂ්පාදන ක්‍රියාකාරකම් වර්ධනය වීම සඳහා දායක විය. පාස්කු ඉරිදා දින සිදුවූ ප්‍රහාරයෙන් පසු බාධා පැමිණ තිබූ ආර්ථික ක්‍රියාකාරකම් නැවත යථා තත්වයට පත්වීම නව ඇණවුම් සහ නිෂ්පාදන ක්‍රියාකාරකම් වල සිදුවූ වර්ධනයට ඉවහල් වූ බව නිෂ්පාදන අංශයෙහි බොහෝමයකගේ ප්‍රතිචාරය විය.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | මැයි | ජූනි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **50.7** | **53.9** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 52.0 | 53.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 55.0 | 56.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 45.0 | 55.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ගැනුම් තොගය | 44.5 | 51.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 52.5 | 51.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ඇණවුම් සහ නිෂ්පාදන ක්‍රියාකාරකම් වල සිදුවූ වර්ධනයත් සමගම, ගැනුම් තොගයෙහි සැලකිය යුතු ඉහළ යාමක් සිදුවිය. තවද, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අඩු වේගයකින් වර්ධනය වීම කෙරෙහි, අමුද්‍රව්‍ය සැපයුම් ඉල්ලුම ඉහළ යාමට අමතරව ආරක්ෂක විධිවිධාන ලිහිල් කිරීම යන කාරණා ද්විත්වයම යම් ආකාරයකට බලපාන ලදී.

සලකනු ලැබූ කාල සීමාවේදී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී.

**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.4 කින් පහළ යමින් 2019 ජූනි මාසයේදී 49.4 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2019 ජූනි මාසයේදී, චීනය, ඉන්දියාව, එක්සත් රාජධානිය, යුරෝපා කලාපය, රුසියාව සහ සිංගප්පූරුව නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි අඩුවීමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවත්, එක්සත් ජනපදය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2019 ජූලි 15 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**53.1**

**2019 මැයි මාසයට සාපේක්ෂව දර්ශකාංක 8.4 ක පහළ යෑමකි.**

2019 ජුනි මාසයේ දී සේවා අංශය යථා තත්ත්වයට පත්විය. පාස්කු ඉරිදා ප්‍රහාරය හේතුවෙන් 2019 මැයි මාසයේ දී අවම අගය වාර්තා කළ සේවා අංශය, ජුනි මාසයේ දී යථා තත්ත්වයට පත්වීම සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ක්‍රියාකාරකම්වල සිදු වූ වර්ධනයන් ප්‍රධාන වශයෙන් හේතු විය.

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව පහළ යෑමට ලක් වූ තොග සහ සිල්ලර වෙළදාම සහ ප්‍රවාහන යන උප අංශවල නව ව්‍යාපාර ක්‍රියාකාරකම් 2019 ජුනි මාසයේ පුළුල් විය. තවද, සංචාරකයන්ගේ පැමිණීම මත විශාල වශයෙන් රඳා පවත්නා නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා සහ අනෙකුත් පෞද්ගලික සේවා යන උප අංශයන්ගේ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයක් සිදු වෙමින් පැවති බව ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කර තිබුණි. පසුගිය දෙමසක් පුරා අඛණ්ඩව පහළ ගිය අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්ද 2019 ජුනි මාසයේ දී ඉහළ ගියේය. කෙසේ නමුත්, පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් ප්‍රමාද වීම හේතුවෙන් සේවා නියුක්ති උප අංශය පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් පහළ ගියේය.




| විචල්‍යය | මැයි | ජුනි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **44.7** | **53.1** | **+** | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| | | <u>උප දර්ශක</u> | | |
| නව ව්‍යාපාර | 49.4 | 57.4 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 41.7 | 57.4 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 36.4 | 44.7 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 46.4 | 44.1 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 49.4 | 61.8 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| | | <u>අනෙකුත් දර්ශක</u> | | |
| අයකරන මිල ගණන් | 50.6 | 47.9 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| අපේක්ෂිත ශ්‍රම පිරිවැය | 64.8 | 63.4 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා අංශයෙහි නිමැවුම් වර්ධන වේගයෙහි වැඩි වීමක් පෙන්නුම් කරමින් ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 මැයි මාසයේ දී මාස 33 කින් වාර්තා වූ පහළම අගය වන 51.6 සිට 2019 ජුනි මාසයේදී 51.9 දක්වා සුළු වශයෙන් ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී. ගෝලීය සේවා අංශයෙහි කැපී පෙනෙන නිමැවුම් වර්ධන වේගයක් මූල්‍ය සේවා උප අංශය තුළ පෙන්නුම් කරන ලදී.

ජපානය, චීනය, එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල සේවා අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ 2019 මැයි මාසයට සාපේක්ෂව ජුනි මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කරන ලද අතර ඉන්දියාවේ එකී දර්ශක අගයේ අඩු වීමක් පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2019 ජූලි 15 වන දිනට*

හෝටල් මඟින් ලබා දුන් වට්ටම් සහ ක්ෂේත්‍රයේ තරගකාරීත්වයට මුහුණ දීම සඳහා ප්‍රවාහන උප අංශයේ සමාගම් විසින් සිදු කළ මිල අඩු කිරීම් හේතුවෙන්, සේවා අංශය විසින් අය කරන මිල ගණන්වල පහළ යෑමක් 2019 ජුනි මාසයේ දී දක්නට ලැබුණි. මේ අතර, ඉදිරි මාස තුන සඳහා සේවා අංශයේ අපේක්ෂිත ශ්‍රම පිරිවැය 2019 ජුනි මාසයේ දී අඩු වේගයකින් ඉහළ යන ලදී.

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන

ගැනුම් තොගය : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය

නිමකිරීමට නියමිත කාර්යයන් : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම්

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.